# 2.9 නිර්මාණාත්මක විචාරශීලි සන්නිවේදනය සඳහා බහුවිෂයයීක අධ්‍යයනයේ වැදගත්කම

ධම්මික බණ්ඩාර හේරත්
ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

## ABSTRACT

කලාව, සාහිත්‍ය හා තාක්ෂණය මත පදනම් වූ නිර්මාණාත්මක සන්නිවේදනය විචාරශීලිත්වය ඔස්සේ සාර සන්නිවේදනයක් බවට පත්වෙයි. ඒ සඳහා සන්නිවේදකයාගේ ඉන්ද්‍රිය ශක්තිය බලපානු ලබයි. නිර්මාණාත්මක සන්නිවේදන විෂය සහ සන්නිවේදන මාධ්‍ය පිළිබඳ ආකල්ප වර්ධනය වීමට පෙර සිටම පැරණි සමාජය තුළ එනම් ක්‍රි. පූ 500 කාලයේ සිට විචාරශීලීත්වයට සහ නිර්මාණශීලීත්වයට ප්‍රමුඛ ස්ථානයක් හිමිව තිබේ. එය නූතන සන්නිවේදන ක්‍රියාවලියට භාවිත කිරීමේදී සන්නිවේදකයා සතුව බහුවිෂයීක අධ්‍යයන ප්‍රවේශයක් අවශ්‍යය.

නූතන නිර්මාණශීලී සන්නිවේදන ක්‍රියාවලිය විචාරශීලීව සිදු කිරීම සඳහා එක් පසෙකින් තාක්ෂණික දැනුම මෙන්ම සමාජ විද්‍යාව, දේශපාලන විද්‍යාව, කළමනාකරණය, ආර්ථික විද්‍යාව භාෂා දැනුම, මානව විද්‍යාව වැනි විවිධ විෂයයන් පිළිබඳ ලබාගන්නා න්‍යායික හා ප්‍රායෝගික අවබෝධය වැදගත් වේ. කිසියම් සංදේශයක් ග්‍රාහකයා තුළ ප්‍රබල බලපෑමක් ඇතිකරවන පරිදි ඉදිරිපත් කිරීම සඳහා සන්නිවේදකයා සංදේශය පිළිබඳව විවිධ විෂයයන් ඔස්සේ ලබාගන්නා දැනුම අවශ්‍ය වේ. සන්නිවේදකයා මුහුණදෙන ක්ෂණික අවස්ථාවන් නිවැරදිව, පැහැදලි ලෙස සහ අර්ථාන්විතව සන්නිවේදනය කිරීමේ ශික්ෂණය ඉගැන්වීම සඳහා බහුවිෂයයීක දැනුම භාවිතයට ගනු ලැබීම ජනසන්නිවේදනය විශ්වවිද්‍යාල ශික්ෂණයක් ලෙස හැඩගැසීම ආරම්භයේ සිට අද දක්වා ගමන්මග තුළ හඳුනාගත හැකි සුවිශේෂී ලක්ෂණයයි.

**Key words** නිර්මාණශීලී, විචාරශීලී, බහුවිෂයයීක, ශික්ෂණය